"මගේ අයිඩෙන්ටිටි තියෙනවා. ඒත් උප්පැන්නේ නැතිවෙලා. මගෙ අම්මට වලංගු නැතිව ගිය වෙලාවේ, උන්දෑගේ බෙත්-හෙත් වල වියදුමට තමයි ඊපීෆ් එක ගත්තේ, වත්තෙන් ලෝම් යවන්න තම ලියුම් කරුවා ඔත්තුකොම හරියට තියෙන්න ඕන. වත්තෙන් යැවිවාම පෙත්වන එන්න මාස 6 ක් විතර යනවා. ඒත් මුදලාලි මාමියා අඩුපාඩු කරලා හදල, මාසෙන් මගේ සල්ලි ටික අරගෙන දුන්නා. කඩේ ණය පොතට කැමෙන් නැති නිසා මගෙන් ගත්තේ 7000/- ක් විතරයි."

යන්තම අවුරු 13 පිරුණ දවසේ සිට රු. 12/- දෛනික වධයට වත්තේ වැඩට ගිය සෙල්ලම්මාට (දැන්වත්ර නාමයකි) ඒ දුෂණය ගැන හරිහැටි තේරුණේ නැත. එහෙත්, 35 වසරක් පුරා වත්තට කනුරා අවසානයේ ඉතිරි වූ රු. 2,45,000/- ක EPF මුදලින් රු 7000/- ක ..... ස්ටෝර්ස් (බදුල්ල) ප්‍රමුඛ පෙළේ ව්‍යාපාරික ස්ථානයකි.) මුදලාලි ඩැහැගත් ටිට ඇයට සියුම් කම්පනයක් දකෙන්නට ඇත.

"මුදලාලි මාත් එක්කම බැංකුවට ගිහින් චෙක්පත මාරුකරලයි 7000/- ගත්තේ. අම්මගේ අසනීපේ ගැන කියලා තව 1000/- ක් වත් අඩු කරගන්න හැදුවත් බැ කිව්ව ... කමක් නෑ... මම උන්දෑ ගොඩ ගත්තේ ඒ සල්ලි වලින්....."

දෙවනි කතාව

"මගේත් හුගක් අය EPF සල්ලි ගන්නේ මුදලාලි ගෙන්. සහතික අඩු වුණත් මුදලාලි ඒව හදල විශ්වාසෙට වැඩේ කරල දෙනව. වත්තේ තලෛයිවර් එක්ක හරි වෙන අඳුනන කෙනෙක් එක්ක හරි ගියාම මුදලාලිට සැකයක් නැහැ. මුදලාලිගේ ගණුදෙණුව ගන්නේ ගිණුමේ නියෙන ගණනේ හැටියට. වැඩිම උණොත් ලක්ෂයකට 10,000 ක් 15,000/- ක් විතර තමයි. ඊට වැඩිය ගන්නේ නෑ.

මෙහේ හුගක් අය EPF සල්ලි ගන්නේ මුදලාලි ගෙන්. සහතික අඩු වුණත් මුදලාලි ඒව හදල විශ්වාසෙට වැඩේ කරල දෙනව

විමසුම් ඇස

EPF ප්‍රතිලාභීන් සූරාකෑමේ නව මුහුණුවරක ජාවාරමක්

තෙවැනි කතාව

"හොර පතලක වැඩට ගිහින් මගේ කොල්ලෝ දෙන්නම පොලිසියෙන් අල්ලගෙන ගියා. උසාවියෙන් ඇප කියල අරගෙන දෙන්න රු. 5000/- ඒවා දෙකක් හොයාගන්න කියලා හිතිලා මෙතන්කා කිව්වා, මගෙ සන්තකේ තිබුණේ EPF එක විතරයි. පණගන්න වෙලා නැති නිසා ඒකත් ගන්න බෑ කියලා වත්තෙන් කිව්ව.

වයස සම්පූර්ණ නැතිනිසා මුදලාලි මහත්තයෝ මුලදී බැම කිව්වා. පස්සේ දරුවගේ කාරණේ කියල හැපෙන්නකොට බැංකු පොත ඉල්ලගෙන රු. 20,000 ක් ණයට දුන්නා. ඊට පස්සෙන් ආපසු විසඳලා 10,000/- ක් දුන්නා. චෙක්පත ආවාම මගේ ලියකියවිලි හදපු ගාස්තුව, ණයයි, ඒවායේ පොලියයි අඩු කරගෙන තව රු. 50,000/- ක් පස්සේ දෙන්නම කියල මුදලාලි ණයට ඉල්ලගන්නා. ගියපු ගාණ ටිකක් වැඩි තමයි, ඒත් ඒ වෙලාවේ මගේ කොල්ලා දෙන්නා බෙරගන්න ඒ කරපු උදව්ව කඩදැක්ක අමතක කරන්න බෑ."

තමා සම්බන්ධ කිසිම හොරකුත් කිසිවෙකුට හෝ හෙළිනොකරන්නැයි කෑදර පිරි දෙනෙකින් යුතුව බැගෑපත්ව ඉල්ලා සිටිමින් 'ඇය' අප හා ප්‍රකාශ කළාය.

රටේ ආර්ථික සංවර්ධනය සඳහා සිය ශ්‍රමය වයස කළ සේවකයින්ගේ වීශ්‍රාම දීවීය සුරැකීමේ අරමුණින්, ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා සංස්ථා ආංශය සඳහා පිහිටුවා ඇති සමාජ සංරක්ෂණ ක්‍රමය වන සේවක අර්ථ සාධක අරමුදලේ සේවක ප්‍රතිලාභ සුක්ෂම ලෙස කොල්ලකෑමේ ක්‍රියාත්මක වන මෙම ජාවාරම පිළිබඳව මුල්වරට අපට අසන්න ලැබුණේ නියෝජ්‍ය හා නීරක්ෂණ ආංශය බදුල්ලේ සිදුකළ ක්ෂේත්‍ර චාරිකාවකදීය. ඒ පිළිබඳව අප "අනාගතේ අපේ අතේ" සංවේදීය පදනම ඇතුළු බදුල්ලේ ප්‍රජාමූල සංවිධාන කිහිපයක් සමඟ සාකච්ඡා කළවිට ඔවුහු එම කොල්ලකෑමට ලක්වී ඇති පුද්ගලයින් රැසක් පිළිබඳව තොරතුරු ගවේෂණය කිරීමට අපට සහය වූහ. තවමත් මුළුමනින්ම සොයාබැලිමී අවසන් වී නොමැති, අපට හෙළිදරවේ වී ඇති තොරතුරු අනුව සේවක අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ නගරයේ මුදලාලි හරහා ලබාගෙන ඇති පුද්ගලයින් රැසකි.



ඔවුහු බදුල්ලේ සෙන් ජේම්ස් වතුයාය, පස්සර ගමේවෙල, කැටවල වත්ත, රොසට් වතුයාය, මොරගොල්ල වතුයාය, හටම්පිටිය, ඩීන්ස් ලෙන්ඩ් ආදී ප්‍රදේශ රැසක් පුරා විසිරී සිටිති. වැඩිම පිරිසක් වතුකරයේ සේවයේ පෙදෙන, හැඳුනුම්පත උප්පැන්න සහතිකය හෝ වෙනත් එවැනි සහතිකයක උනනාපාය නිසා මුදලාලිට හසුවූ අභිංසකයෝය. තවත් සමාරක් ඉක්මහින්ම EPF ප්‍රතිලාභය ලබාගැනීමට ඇති අවශ්‍යතාවය නිසා ඊට හසුවූවෝය. දැනට අපට හෙළිදරවේ වී ඇති තොරතුරු අනුව බදුල්ල නගරයේ මෙවැනි මුදලාලි ලා දෙදෙනෙකි. බණ්ඩාරවෙල නගරයේ තවත් එක් ව්‍යාපාරිකයෙකි.

මුදලාලි හරහා EPF ප්‍රතිලාභ ලබාගත් පිරිස් හෙළිදරවේ කරන තොරතුරු අනුව, අදළ ලියකියවිලි භාරදෙන අවස්ථාවේ මුදලාලි සන්තකයේ තැබීය යුත්තේ බැංකු ගිණුමේ පාස්පොත පමණි. EPF ප්‍රතිලාභ චෙක්පත ලැබෙනුයේ එම ගිණුම වෙතය. බොහෝ ඊට මුදලාලිගේ ගණුදෙණු බේරාගැනීම සිදුවන්නේද බැංකුව තුළදීමය.

කොල්ලකෑමට ලක්වූ ප්‍රතිලාභීන්ගෙන් අති බහුතරය ඒ පිළිබඳව කිසිවක් සිය නමින් හෙළිදරවේ කිරීමට අකමැති, දැඩි බියෙන් ජීවත්වන අභිංසකයින් වීම නිසා 'මුදලාලිලා' අපහසුවකින් තොරව සිය කාර්යය සිදුකරගෙන යාමට හැකියාව ලැබී තිබේ.

මෙම දූෂණයේ වඩාත් අවධානය යොමුවිය යුතු කාරණය වන්නේ, කවර ආකාරයේ අත්‍යාවශ්‍ය ලියවිල්ලක් නොමැතිව වුවද, ඒ අඩුපාඩුව සම්පූර්ණ කරමින් සැසෙකින් ප්‍රතිලාභ චෙක්පත ලබාගැනීමට 'මුදලාලිලා' සතුව ඇති හැකියා-වයි. මෙම දූෂිත ජාලය, සේවක අර්ථ සාධක අරමුදලේ හා කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පුටු කිහිපයක් පුරා විහිදී ඇති බවට එමගින් ඉඟි සපයයි. එසේම මෙම නව ක්‍රමවේදය ශ්‍රී ලංකාවේ තවත් ප්‍රදේශ පුරා විහිදී ඇතිබොදද සැකයක් නැත.

රුපියල් බිලියන 400 ක් ඉක්මවන, විශාල සම්පත් ප්‍රමාණයකින් හා රටේ මුළු ශ්‍රම බලකායෙන් 30% ක් පමණ වූ සාමාජික සංඛ්‍යා-වක් ආවරණය කෙරෙන, ශ්‍රී ලංකාවේ ඉතා වැදගත් සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයක් ලෙස සැලකෙන සේවක අර්ථ සාධක අරමුදල මෙවැනි දූෂණ ක්‍රමවේද අනුමත නොකරනු ඇතිවාට කිසිදු සැකයක් නැත.

මේ සම්බන්ධයෙන් ඔබ දන්නා තවත් තොරතුරු, ඔබට මුහුණදීමට සිදුවූ අත්දැකීම්,

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය වෙත මෙන්ම,
තැ.පෙ. 1299, කොළඹ යන ලිපිනය ඔස්සේ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරි වරයා වෙතද දැනුම්දිය හැකිය.

යහපාලන වැඩමුලු වලින් අගනා ප්‍රතිඵල

DISTRICT SECRETARIAT - BADULLA

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල
District Secretary 055-2222235
සාධාරණ ලේකම්
Office 055-2222310 / 055-2222493 / 055-2222233
දුරකථන අංකය
Fax 055-2222292
ඊ-මේල් ලිපිනය
E - mail gabadul@sltl.lk
දිනය
Date 2008.09.18
අපේ අංකය
Our Number
මගේ අංකය
Your Number

ජේසී. වැළිඅමුණ මහතා,
විධායක අධ්‍යක්ෂ,
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය,
26/1, මුල්දාස් පදුමන,
කොළඹ 07.

RECEIVED 29 SEP 2008 BY:.....

මහත්මයාණෙනි,

පිරිසිදු හා පිළිවුතු රාජ්‍ය සේවයක් උදෙසා

ඔබ ආයතනයේ මෙදිනවේලම මත යහපාලන ආකල්ප ප්‍රචාරවිය හේතා කොට ගෙන බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම්වරුද ඇතුළු පරිපාලන රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමට හා ඔවුන් තුල අකැළඹලීමක වෙනසක් ඇති කිරීමට දායක වූ උත්තරය පිළිබඳව අප්‍රමිත වන්නේ වෙමි. දිස්ත්‍රික්කයේ යහපාලන සංකල්පයන් ප්‍රචාරණය උදෙසා ඔබ ආයතනය විසින් පවත්වන ලද වැඩමුලට ඇතිල් ඇස්වූ පිළිබිඳ මේ වන විට බදුල්ල පොස්වී ඇත.

02. ජන හිතවාදී රාජ්‍ය සේවයක් හොඳැසැයීම සඳහා ඔබ ආයතනය වෙතින් දැල පත්තරය පෙරදැරි කරගෙන මෙවර ජාතික එලදායිතා කරගසේ, උසාව පළාතේ අත්තර දෙපාර්තමේන්තු අංශයේ කරගසේ ප්‍රධාන ස්ථානය බදුල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හිමිකර ගැනීමට සමත් වූ අතර, හාලිඅෙල, අල්ල, සපුකලේ, බණ්ඩාරවෙල හා පස්සර යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල පළාත් මට්ටමේ ජයග්‍රහණ ලබා ගැනීම ප්‍රාදේශීය පරිපාලකයන් ගියලුවා ලෙස ඔබ වෙත දැනුම් දෙන්නේ ඉමහත් සතුටිනි. තවද, උසාව පළාත් සහාවෙහි ආයතන හා පාසල් ගණනාවක්ද මෙවර ජාතික එලදායිතා කරගසෙන් සම්මාන ලබා ඇත.

අප ආයතනය බදුල්ල දිස්ත්‍රික්කයේ යහපාලන සංකල්පයන් ප්‍රචාරණය කිරීම උදෙසා පවත්වන ලද වැඩමුලු තුළින් ඇතිවූ පිබිදීම මේ වන විට මළුවල ගැබිනි ඇතැයි බදුල්ල දිස්ත්‍රික් ලේකම් රෝහණ කීරිති දිසානායක මහතා කියයි.

ජන හිතවාදී රාජ්‍ය සේවයක් ගොඩනැගීම සඳහා අප ආයතනය වෙතින් කරන ලද පන්තරය පෙරදැරි කරගෙන මෙවර ජාතික එලදායිතා තරඟයේ ජයග්‍රාහකයන් තරඟයේ සිය ශ්‍රේෂ්ඨ කාර්යාලය හිමිකර ගැනීමට සමත්වූ බව ඒ මහතා විසින් අප ආයතනය වෙත එවා ඇති ලිපියක සඳහන්වේ.

ප්‍රතිචාරය අපූරුයි

සුපිළිපන්නභාවය වැඩි දියුණු කිරීම පිළිබඳ අප විසින් පසුගියදා සංවිධානය කෙරුණු වැඩ සටහන් වලට සහභාගිවූවන්ගෙන් ලැබුනේ මහඟු ප්‍රතිචාරයකි. සමාජයීය ගැටලු වලට උපක්‍රමශීලීව මුහුණදීමට මෙම වැඩ සටහන් ඉවහල් වන බව ඔවුහු කීහ.

දිවයින පුරා මෙවන් වැඩ සටහන් පැවැත්වීමේ අගය පෙන්වාදුන් ඔවුන් කියාසිටියේ ඒවා නිලධාරීන්ට පමණක් නොව මහජනයා වෙනුවෙන්ද පැවැත්විය යුතු බවයි.

ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනය සමග හවුල්වව හලාවත සහ බදුල්ලේ පවත්වන ලද වැඩ සටහන් සඳහා ප්‍රාදේශීය සභා, නගර සභා සහ මහ නගර සභා සාමාජිකයෝ සහභාගිවූහ.

ඒවා ඉතාමත් සාර්ථකවූවා මෙන්ම බෙහෙවින් ඵලදායි බව එහෙළාම ඔවුහු කියා සිටියහ. රාජකාරී මෙන්ම පෞද්ගලික මට්ටමින්ද ඒවායින් විශාල දැනුමක් ලබාගත් බවත් යහ පාලනය සඳහා අනුමතය කළයුතු ක්‍රියාමාර්ගයන් ගැන මනා අවබෝධයක් ලබාගැනීමට ඉවහල්වූ බවත් ඔවුහු ප්‍රකාශ කළහ.

''අපට දන් පෙරට වඩා කාර්යක්ෂමව කටයුතු කළ හැකිය'' යි ඔවුහු කීහ.

දෙසැම්බර් 9 වෙනිද

එක්සත් ජාතීන්ගේ දූෂණ විරෝධී දිනයයි.
ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ලංකා ආයතනය එදින සැමරීම සඳහා.....

- ජාතික සුපිළිපන් ප්‍රණාම 2008 ප්‍රදානය
- ශ්‍රී ලංකාවේ පාලන තත්ත්ව වාර්තාව 2008 එළිදැක්වීම
- දූෂණ විරෝධී කාටූන් නිර්මාණ තරඟයේ ජයග්‍රාකයන් ප්‍රකාශයට පත්කිරීම
- කාටූන් නිර්මාණ ප්‍රදර්ශනය
- සංවිධානය කර ඇත.

ස්ථානය: බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව

සුපිළිපන්

ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා (TISL) - පුවත් හසුන | 03 වන වෙළුම | ඔක්තෝබර් 2008

විධායක අධ්‍යක්ෂට එල්ලවූ බෝම්බ ප්‍රහාරය ගැන

දස දෙසින් විරෝධතා පළවෙයි

සැප්තැම්බර් 28 වෙනිදා ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ මාතව හිමිකම් නිතීඥ ජේ සී වැලිඅමුණ මහතාගේ නිවසට එල්ලකළ ග්‍රෙනේඩ් බෝම්බ ප්‍රහාරය තදින්ම හෙළාදැටු දේශීය සහ අන්තර්ජාතික සංවිධාන ඊට සම්බන්ධ පුද්ගලයින් වහාම අත්අඩංගුවට ගන්නා ලෙස එක හඬින් ඉල්ලා සිටියහ.

සිද්ධිය පිළිබඳව මාධ්‍ය ප්‍රකාශ නිකුත්කෙරෙණු අතර අලුත්කඩේ උසාවිය ඉදිරිපිට නීතිඥයින්ගේ පෙළපාලියක් පැවැත්විණ. සිවිල් සමාජ එක්ව විරෝධතා රැලියක් සංවිධානය කෙරිණි. ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නියෝජිත පිරිසක් ජනාධිපතිවරයා හමුවී නිසි පියවර ගන්නා ලෙස ඉල්ලා සිටියහ.

ඔක්තෝබර් 3 වැනිදා පැරැල් සංවිධානය, මාර්ග ආයතනය, ජාතික සාම මණ්ඩලය, දකුණු ආසියානු කුඩා අවි පාලන සංවිධානය සහ නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය එක්ව ලිප්පන් වටරවුමේ පැවැත්වූ විරෝධතා රැලියට විශාල පිරිසක් සහභාගිවූහ.

සිද්ධිය ඇතිවී දෙදිනකින් පසු අලුත්කඩේ උසාවි සංකීර්ණය ඉදිරිපිට පවත්වන ලද නීතිඥවරුන්ගේ පෙළපාලියට නීතිඥයින් විශාල පිරිසක් සහභාගිවූ අතර ඔවුන් කියාසිටියේ එය එක් පුද්ගලයකුට නොව රටේ නීති වෘත්තීකයන්ටම එල්ලවූ තර්ජනයක් බවයි. මේ අතර විවිධ ආයතනවලින් නිකුත් කෙරුණු ප්‍රකාශ වලට පුලුල් මාධ්‍ය ප්‍රචාරයක් ලැබුණි.

විස්තර 2 වෙනි පිටුවේ

ජනාධිපති උපදෙස්

වැලිඅමුණ මහතා වෙත එල්ලකළ බෝම්බ ප්‍රහාරය පිළිබඳ පරීක්ෂණ ඉක්මණින් පවත්වා වැරදිකරුවන් සිරභාරයට ගන්නා ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පොලිස්පති ජයන්ත වික්‍රමරත්න මහතාට උපදෙස් දී ඇතැයි රජයේ මාධ්‍ය වාර්තා කර තිබුණි.

කෙසේවුවද, මාසයක් ගතවුවත් මෙතෙක් සිද්ධියට වගකිවයුතු කිසිවකු ගැන ඝෝෂාවක් නැත.

අප ආයතනයේ අවධානය

ක්‍රියාකාරීන්, මාධ්‍යකරුවන් සහ සිවිල් සමාජයට විරුද්ධව කෙරෙන පහරදීම් දිගින් දිගටම කරගෙන යෑම පිළිබඳව බලවත් අවධානය යොමුවිය යුතුයයි සිද්ධිය සිදුවූ සැනින් ප්‍රකාශයක් නිකුත්කරමින් TISL ආයතනය කියා සිටියේය.

ලෝ පුරා සියලු ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් සංවිධාන වලට සිද්ධිය ගැන දැනුවත් කළ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනය, වැලිඅමුණ මහතාගේ ජීවිතය රැකගැනීම ගැන කවුරුත් සිය සහයෝගය දක්වනු ඇතැයි බලාපොරොත්තුවන බව දැන්වීය.

Lawyers' demonstration (left) & demonstration by civil society organizations

ජාත්‍යන්තර සාමාජිකයෝ හෙළාදකිති

වැලිඅමුණ මහතාගේ නිවසට එල්ල කළ බෝම්බ ප්‍රහාරය ගැන ට්‍රාන්ස්පේරන්සි ඉන්ටර්නැෂනල් ජාත්‍යන්තර ආයතනයේ වාර්ෂික සාමාජික රැස්වීමේ අවධානය යොමුවිය. ඔක්තෝබර් 30 වෙනිදා ග්‍රීසියේ ඇතන්ස් නුවරට රැස්වූ 1300 ක් පමණ සාමාජිකයින් විසින් සම්මත කෙරුණු යෝජනාවක් මගින් සිද්ධිය හෙළාදකිනු ලැබීය.

දූෂණ විරෝධී ක්‍රියාකාරීන්ට එරෙහිව කෙරෙන තර්ජන එන්න එන්නම වැඩිවෙන බව සඳහන් එම යෝජනාවේ වැලිඅමුණ මහතා වෙත එල්ලවූ ප්‍රහාරය ගැන කෙළින්ම සඳහන් විය.

ඇතුළු පිටු

2 ප්‍රජාතන්ත්‍රවාදී අගයන්ට එරෙහිව කළ ප්‍රහාරයකි
3 දූෂණ තත්ත්ව දර්ශකය 2008
4 ඉන්දියාවේ තොරතුරු පනත සාර්ථකයි
5 විමසුම් ඇස
6 යහපාලන වැඩමුලු වලින් අගනා ප්‍රතිඵල

පළමු පිටුවෙන් .....

වැලිඅමුණ බෝම්බ ප්‍රහාරය හෙළා දකිමින් විවිධ සංවිධාන ප්‍රකාශ නිකුත් කළහ. පහත පළවන්නේ එවන් ප්‍රකාශ කීපයකින් උපුටාගත් කොටස්ය.

ශ්‍රී ලංකා වෘත්තීය පත්‍රකලාවේදීන්ගේ සංගමය, මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය, ශ්‍රී ලංකා මුස්ලිම් ජනමාධ්‍යවේදීන්ගේ සංසදය, ශ්‍රී ලංකා දෙමළ ජනමාධ්‍යවේදීන්ගේ සන්ධානය සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය එක්ව නිකුත් කළ ප්‍රකාශයකින් කියාසිටියේ බීයජනක ප්‍රතිවිපාක ඇති කරන දරුණු වර්ධනයක් ලෙස තම සංවිධාන මෙම ප්‍රහාරය සළකන බවයි.

බෝම්බ ප්‍රහාරය තරයේ හෙළා දකිමින් ප්‍රකාශයක් නිකුත් කළ **ප්‍රජාතන්ත්‍රීය අයිතිවාසිකම් රැකගැනීමේ ව්‍යාපාරය**, එම පහත් ක්‍රියාව කිරීමට හේතු වශයෙන් තිබිය හැකි බව දක්වා සිටියේ, මූලික අයිතිවාසිකම් උල්ලංඝනයන්ට ප්‍රබල අභියෝග එල්ලකරමින් අධිකාරණයේ ක්‍රියාකාරීත්වයත්, වංචා හා දූෂණවලට එරෙහිව අභිතව ඉදිරිපත් වීමත්ය.

"වැලිඅමුණ මහතා ජනතාවගේ නීතිඥයෙකි. එවැන්නකුට කරන තර්ජනය ජනතාවම බීය ගැන්වීමක් බවත් මීට එරෙහිව නැගී සිටීම ජනතා උරුමයක් ලෙස නොපමාව භාවිත කළයුතු බවත් අපි අවධාරණය කරමු" යයිදැ ප්‍රකාශයේ සඳහන් වේ.

වැලිඅමුණ මහතාට එල්ල වූ මැර ප්‍රහාරය දැඩි ලෙස හෙළා දකිමින් **ඇමෙරිකානු තානාපති කාර්යාලය** නිවේදනයක් නිකුත් කර තිබිනි. ඒ මහතා මෙරට මානව හිමිකම් සුරක්ෂිත කරලීම සඳහා විශේෂ වැඩකොටසක් සිදුකරමින් සිටින්නෙකු බවත් අල්ලස සහ ජනමාධ්‍ය ද ඇතුලව විවේචනාත්මක සහ විරෝධකාරීසිත ඇදහස් උදාහස් පාලනය කිරීමට දරනු ලබන තැනකි. එමෙන්ම මෙම ක්‍රියාව නීති වෘත්තියේ ස්වාධීනත්වයට සහ සත්‍ය ගරුකතාවයට අභිලංග කිරීමක් ද වේ.

"මෙම සාහසික අපරාධකරුවන් අල්ලා නීතිය හමුවට පැමිණවීම පිණිස වහාම සම්පූර්ණවූත්, ස්වාධීනවූත්, අපක්ෂපාතීවූත් පරීක්ෂණයක් ආරම්භ කරන ලෙසත්, එම පරීක්ෂණ ප්‍රතිඵල ප්‍රසිද්ධ කරන ලෙසත් අඳළ බලධාරීන් වෙත අප සංවිධාන බලකර කියා සිටී. මෙම පරීක්ෂණයට මෙයට පෙර මෙවැනි පරීක්ෂණයන්ට අත්වූ ඉරණම අත් වී කාලයේ වැලිතලාවෙන් වැසී නොයනු ඇතැයි අප සංවිධාන අපේක්ෂා කරයි."

බෝම්බ ප්‍රහාරය පිළිබඳව සම්පූර්ණ හා ස්වාධීන විභාගයක් පැවැත්වීමටත්, සිද්ධියට අදළ පුද්ගලයන් පිළිබඳ දැඩි ක්‍රියාමාර්ගයක් ගැනීමටත් කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා නීතිඥ සංගමය බලධාරීන්ගෙන් ඉල්ලා සිටියේය.

එම ප්‍රහාරය පිළිකුල් සහගතව තරයේ හෙළා දකින අතර ඒ සම්බන්ධව සම්පූර්ණ හා ස්වාධීන විභාගයක් පැවැත්වීම හා සිද්ධියට අදළ පුද්ගලයන් පිළිබඳ දැඩි ක්‍රියාමාර්ග ගැනීම අප්‍රමාදව සිදු කරත ලෙස නීතිඥ සංගමය පොලිස්පති ඇතුළු සියලු බලධාර ආයතනයන්ගෙන් ඉල්ලා සිටියේය.

බෝම්බ ප්‍රහාරය සිදුවී සති තුනකට පසු "ඉරැදින" පුවත් පතට කළ ප්‍රකාශයකින් **ජාතික වෘත්තීය සමිති සම්මේලනයේ** සභාපති කේ.වීලායුදන් මහතා මෙසේ කීය. "අද වන තුරු එම ප්‍රහාරය පිළිබඳව කිසිවක් සොයා ගැනීමට නොහැකි වී තිබෙනවා. මේ දක්වා පැහැරගෙන යාම් කරන සුදු වෑන් වල කිසිවෙක් අත්අඩංගුවට ගැනීමට හැකි වී නැත. මාධ්‍යවේදීන් ඝාතනය කළ සහ ඔවුනට පහර දුන් කිසිවෙක් අත්අඩංගුවට ගෙන නැහැ. මේ අනුව හිතිය ක්‍රියාත්මක කිරීමට පොලිසියට හැකියාවක් ලැබී තිබෙනවාද යන ප්‍රශ්නය මතු වී තිබෙනවා. එමගිනා හිතිය සහ සාධාරණත්වය මේ රටේ තිබෙනවා නම්, ඕනෑම අයකුට මේ රටේ ජීවත් වීය හැකි වාතාවරණයක් තිබිය හැකි බව ඔප්පු කර පෙන්වීය හැක්කේ බලයේ සිටින රජයටයි. එම නිසා ජනතාවට බියෙන් තොරව ජීවත්වීය හැකි තත්ත්වයක් නිර්මාණය කිරීමට රජයට වගකීමක් තිබෙනවා."

"ප්‍රජාතන්ත්‍රවාදී අගයන්ට එරෙහිව කළ ප්‍රහාරයක්"

"මේ වනාහී මානව හිමිකම් නීතිඥයකු බිය ගැන්වීමටත්, ඒ මගින් මානව හිමිකම්, යහ පාලනය, වගවීම සහ පාලකයන්ගේ අවංකබව උදෙසා පෙනී සිටින සහ උද්ඝෝෂණය කරන සියළු දෙනා වෙත බිය ගැන්වීමේ සංඥවක් යැවීමටත් අරමුණු කරන ලද බීයගුළු ප්‍රහාරයකි. මෙමගින් මෙම ප්‍රහාරය අප සමාජයෙහි සිවිල් සමාජය සහ ජනමාධ්‍ය ද ඇතුලව විවේචනාත්මක සහ විරෝධකාරීසිත ඇදහස් උදහස් පාලනය කිරීමට දරනු ලබන තැනකි. එමෙන්ම මෙම ක්‍රියාව නීති වෘත්තියේ ස්වාධීනත්වයට සහ සත්‍ය ගරුකතාවයට අභිලංග කිරීමක් ද වේ.

"මෙම සාහසික අපරාධකරුවන් අල්ලා නීතිය හමුවට පැමිණවීම පිණිස වහාම සම්පූර්ණවූත්, ස්වාධීනවූත්, අපක්ෂපාතීවූත් පරීක්ෂණයක් ආරම්භ කරන ලෙසත්, එම පරීක්ෂණ ප්‍රතිඵල ප්‍රසිද්ධ කරන ලෙසත් අඳළ බලධාරීන් වෙත අප සංවිධාන බලකර කියා සිටී. මෙම පරීක්ෂණයට මෙයට පෙර මෙවැනි පරීක්ෂණයන්ට අත්වූ ඉරණම අත් වී කාලයේ වැලිතලාවෙන් වැසී නොයනු ඇතැයි අප සංවිධාන අපේක්ෂා කරයි."

බෝම්බ ප්‍රහාරය පිළිබඳව සම්පූර්ණ හා ස්වාධීන විභාගයක් පැවැත්වීමටත්, සිද්ධියට අදළ පුද්ගලයන් පිළිබඳ දැඩි ක්‍රියාමාර්ගයක් ගැනීමටත් කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා නීතිඥ සංගමය බලධාරීන්ගෙන් ඉල්ලා සිටියේය.

ශ්‍රී ලංකාව දූෂණ තත්ත්ව දර්ශකයේ අනු දෙවන ස්ථානයේ....

දූෂණයට එරෙහි අරගලයන් මෙහෙයවන ප්‍රධාන විශ්ව සිවිල් සමාජ සංවිධානය වූ ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ආයතනය (TI) විසිදැක්වූ දූෂණ තත්ව දර්ශකයට අනුව ශ්‍රී ලංකාව රටවල් 180ක් අතුරින් 92වන ස්ථානය ලබා ඇත.

ශ්‍රී ලංකාව ලබා ඇති ලකුණු ප්‍රමාණය 3.2ක් වන අතර එය රාජ්‍ය අංශය තුළ බරපතල දූෂණ ප්‍රවණතාවන් පෙන්නුම් කරයි. තූනානය හැර අසල්වැසි රටවල් සියල්ල ලබා ඇත්තේ ලකුණු 3.5කට අඩු ප්‍රමාණයකි. ශ්‍රී ලංකාවේ පාලන තත්ත්වය තුළ ප්‍රධාන ප්‍රශ්න ලෙස උපුටා දක්වා ඇත්තේ දේශපාලන පක්ෂයන්ට මුදල් සපයන මූලාශ්‍රයන්හි රහසස්භාවය හා පාර්ලිමේන්තුවේ දුර්වල අධීක්ෂණයයි. ලකුණු 3ට වඩා ලබා ඇත්තේ ඉන්දියාව (3.4) හා ශ්‍රී ලංකාව පමණක් වන අතර මාලදිවයින (2.8), නේපාලය (2.7), පාකිස්තානය (2.5) හා බංග්ලාදේශය (2.1) අඩු ලකුණු මට්ටමක තව දුරටත් පසුවේ.

කාටූනය: ඩේලිමිරර පුවත්පතින්

ඒ ඒ රටවල රාජ්‍ය නිලධාරීන් හා දේශපාලඥයන් අතර කොතෙක් දුරට දූෂණය පවතින්නේදැයි දකින ආකාරයට අනුව මෙම දර්ශකය තුළ රටවල් පෙළ ගස්වන බවයි. එය සෑම රටකම දූෂණය ලකුණු 0 සිට 10 දක්වා වූ පරාසයක් තුළ මිනුම්කොට පිහිටුවයි. 10 ඩබාත්ම සුපිරිසිදු වන අතර 0 ඉතාමත්ම දූෂිත වේ.

දූෂණ තත්ව දර්ශකයේ වැදගත්කම විස්තර කරමින් ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා ආයතනයේ විධායක අධ්‍යක්ෂ ජේ.සී. වැලිඅමුණ මහතා පවසන්නේ,

දූෂණ තත්ත්ව දර්ශකය රාජ්‍ය අංශයේ දූෂණය පිළිබඳ අවධානය යොමු කරයි. මෙම දර්ශකය සඳහා දූෂණය අර්ථ නිරූපණය කරන්නේ පෞද්ගලික ලාභයක් සඳහා රාජ්‍ය තනතුර අයුතු ලෙස පරිහරණය කිරීමක් ලෙසයි.

දර්ශකය සකස් කිරීමේදී භාවිත කළ සමීක්ෂණයන්වලදී පෞද්ගලික ප්‍රතිලාභ සඳහා